චක්‍රලේඛ අංකය: 02/2003

මගේ අංකය: එම්10/විවිධ/ම/19/2002
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 03.
2003.04.10

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

........................

## මුස්ලිම් භක්තිකයන්ගේ මරණ ලියාපදිංචි කිරීමේදී සිදුවන ප්‍රමාදයන් මග හරවා ගැනීම

මුස්ලිම් භක්තිකයෙකු මියගිය විට එම අවස්ථාවේදීම එම දේහයේ අවසන් කටයුතු ඉස්ලාම් ධර්මයේ නීතියට හා සම්ප්‍රදායට අනුව හැකි ඉක්මනින්ම සිදු කිරීමට කටයුතු කළයුතු වේ.

02. නමුත් සමහරක් අවස්ථාවලදී මරණයක් ලියාපදිංචි කිරීමට උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් වරයෙකු හෝ වරියක ලඟට ගියවිට එම නිලධාරින් වෙත පැවරී ඇති එම කාර්යය නිසි පරිදි කලට වේලාවට සිදුකර නොදීමේ හේතුවෙන් මියගිය තැනැත්තාගේ ඥාතීනට විවිධ වූ ගැටළුවලට මෙන්ම දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවේ. යම්කිසි මරණයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලිපිලේඛණ නීත්‍යානුකූලව ඉදිරිපත් කළද මරණය ලියාපදිංචි කර ගැනීමට නොහැකි වීම මෙයට ප්‍රධානතම හේතුවකි.

03. විශේෂයෙන්ම සතියේ නිවාඩු දිනයන්හි මෙන්ම ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හිදී හා රාත්‍රි කාලයේදී මරණයක් ලියාපදිංචි කරදීමට අදාල රෙජිස්ට්‍රාර් මහතුන් මහත්මීන් තම රාජකාරිමය කටයුතු සිදු කිරීමට ඉදිරිපත් නොවීම නිසා මියගිය මුස්ලිම් භක්තිකයෙකුගේ දේහය සම්බන්ධයෙන් **භූමදාන** කටයුතු කරගත නොහැකිව මියගිය පුද්ගලයාගේ ඥාතීන් ඉතා අසරණ තත්වයකට පත්වී ඇති බව වාර්තා වී ඇත.

04. මේ සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ සිටින උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කර මුස්ලිම් භක්තිකයන්ගේ මරණ හැකිතාක් ඉක්මනින් ලියාපදිංචි කර දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔබතුමාට උපදෙස් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. සභාපති, ශ්‍රී ලංකා මුස්ලිම් අවමංගල්‍ය සේවා සංවිධානය,
ඔබගේ අංක 145/5/69(v1) හා 2002.12.05 ලිපියට
අදාලව දැනගැනීම සඳහා

2. ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
ලේකම්- ඔබගේ අංක එම්එච්/එල්ජී/8/අයි/1-Iv-Iv හා
2003.03.04 දිනැති ලිපියට අදාලව.

නා/4/9